**ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය හා මැලේරියා පිටුදැකීම සඳහාවූ ගෝලීය අරමුදල (GF) යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය (CCMSL) සඳහා සිවිල් සංවිධාන සාමාජිකත්වය ලබාගැනීම සහ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම**

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය (CCMSL) සඳහා සිවිල් සංවිධාන සාමාජිකත්වය ලබාගැනීම හෝ ඒ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සුදුසුකම්ලත් සංවිධාන/පුද්ගලයන්ගෙන් ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ ලේකම් කාර්යාලය අයදුම්පත් කැඳවනු ලැබේ.

2002 වර්ෂයේ පිහිටවනු ලැබූ ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය හා මැලේරියා පිටුදැකීම සඳහා වූ ගෝලීය අරමුදලේ සමස්ත ඉලක්කය වන්නේ ඉහත කී රෝග මර්දනය, සම්පත් එක්රැස් කිරීම, කළමනාකරණය හා බෙදා හැරීම සමග සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමය.

ඒ සඳහා සුදුසු රටවල ඉහත කී රෝග මර්දනය, පාලනය සහ සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කිරීම වෙනුවෙන් මූල්‍ය සම්පත් ලබා ගැනීමේ අවස්ථා ලබාදී ඇත. 2003 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව ඉහත අරමුණු වෙනුවෙන් මූල්‍යාධාර හා තාක්ෂණික සහය ලබමින් සිටී. 2025 සිට 2027 වර්ෂ සඳහාද මූල්‍යාධාර හා තාක්ෂණික සහය ලබා ගැනීමට ශ්‍රී ලංකාව වරප්‍රසාද ලබා ඇත.

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය ජාතික එකමුතු කණ්ඩායමක් ලෙස ක්‍රියාකරණ අතර එය පිහිටුවා ඇත්තේ ගෝලීය අරමුදලේ අවශ්‍යතාවය මත සහ එහි නිර්දේශ මත වන අතර අරමුදල් ව්‍යාපෘති ආධාරවල සුරක්ෂිතභාවය හා අධීක්ෂණය දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය මගින් සිදු කෙරේ. මෙය දේශීය වශයෙන් සම්බන්ධීකරණයෙන් සහ විවිධ පාර්ශව සම්බන්ධ කරගැනීමෙන් ඉහත කී රෝග පැතිරීම අඩුකිරීම, රෝග වලින් සිදුවන හානිකර තත්ව අවම කිරීම සහ මරණ වලක්වාගත හැකි වීම යන ගෝලීය අරමුදල විසින් හඳුනාගෙන ඇති සංකල්ප මත පදනම් වේ.

ගෝලීය අරමුදල් වල සහයෝගය අපේක්ෂිත රටවල්වල දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ සාමාජිකයන් රාජ්‍ය, සිවිල් සංවිධාන, ද්වි පාර්ශවික/බහු පාර්ශවික හවුල්කරුවන් ලෙස පත්කර ගැනීම අපේක්ෂා කෙරේ. දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ සාමාජිකයන් ස්වේච්ඡා ගරු සේවයක් ලෙස ක්‍රියා කිරීම අපේක්ෂා කරන අතර ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය රෝග මර්දන වැඩසටහන් සාර්ථක කර ගැනීමට අත්‍යාවශ්‍ය වේ.

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය නියෝජනය කිරීම සඳහා සිවිල් සංවිධාන වලින් නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සිදුවන්නේ ඔවුන්ගේ අදාල ක්ෂේත්‍රයන් මගිනි. එකී සාමාජිකත්වය ලබා ගැනීමට/තෝරාපත් කරගන්නා ඡන්ද විමසීමට ඉදිරිපත්වීමට අපේක්ෂිත පහත ලැයිස්තුවට අදාල නිල වශයෙන් ලියාපදිංචි සංවිධාන ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණය වෙත සිය "කැමැත්ත ප්‍රකාශ කිරීම්" කරන ලෙස යාන්ත්‍රණ ලේකම් කාර්යාලය ඇරයුම් කරයි.

දැනට ගෝලීය අරමුදල් ව්‍යාපෘතිවල ප්‍රධාන ලැබුම්කරුවන්, උප ලැබුම්කරුවන් සහ උප උප ලැබුම්කරුවන් සහ ඉදිරි ව්‍යාපෘති සඳහා ප්‍රධාන ලැබුම්කරුවන්, උප ලැබුම්කරුවන් හා උප උප ප්‍රධාන ලැබුම්කරුවන් වීමට අපේක්ෂිත සංවිධානයන්ටද සාමාජිකත්වය වෙනුවෙන් අයදුම්කල හැක. ඡන්දය ප්‍රකාශ කරන්නන් සහ සාමාජිකත්ව අපේක්ෂකයන්ගේ ව්‍යාපාර අරමුණු සහ දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ අරමුණු අතර පරස්පරතාවයන් නොතිබිය යුතුය. ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ සාමාජිකත්ව අපේක්ෂකයන් අදාල ක්ෂේත්‍රය සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබයි.

සාමාජික කාණ්ඩ ලැයිස්තුව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 1. | **රාජ්‍ය නොවන සංවිධාන** | **සාමාජිකත්ව 5** |
| 2. | **ඉහත රෝග තුනෙන් බලපෑම් ඇති කාණ්ඩ (KP)** | **සාමාජිකත්ව 2** |
| 3. | **පුද්ගලික අංශය** | **සාමාජිකත්ව 1** |
| 4. | **විශ්වාසය මත පදනම් වූ ආයතන/සංවිධාන** | **සාමාජිකත්ව 1** |
| 5. | **අධ්‍යාපන අංශය** | **සාමාජිකත්ව 1** |
| 6. | **රෝගීන් සහ රෝගී කණ්ඩායම් අතර ජීවත්වන්නන් (එච්.අයි.වී./ඒඩ්ස්)** | **සාමාජිකත්ව 1** |
| 7. | **රෝගීන් සහ රෝගී කණ්ඩායම් අතර ජීවත්වන්නන් (ක්ෂය රෝගය)** | **සාමාජිකත්ව 1** |

**අපේක්ෂකයින් සහ ඡන්ද දායකයින් තෝරා ගැනීම සඳහා වන සමස්ථ නිර්නායකයන් පහත සඳහන් පරිදි වේ** :

**1) රාජ්‍ය නොවන සංවිධාන සඳහා**

අයදුම්කරුවන් ගේ සංවිධාන 1980 අංක 31 පනත යටතේ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයයේ හෝ සමාගම් පනත යටතේ හෝ භාරයක් ලෙස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයයේ හෝ ලියාපදිංචි වී තිබිය යුතු ය. එම සංවිධාන අවම වශයෙන් අවුරුදු 3 ක කාලයක්වත් සෞඛ්‍ය අංශය සමග සම්බන්ධව හෝ ඊට ලැදියාවක් සහිතව කටයුතු කර තිබිය යුතු ය.

**2) ඉහත රෝග තුනෙන් බලපෑම් ඇති කාණ්ඩ (KP)**

මුඛ්‍ය ප්‍රජාවන් විසින් මූලිකත්වය දෙන පසුගිය අවුරුදු 3ක කාලයක් ක්‍රියාකාරීවූ ඕනෑම සංවිධානයක් මෙම ආසනය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබයි.

මුඛ්‍ය ප්‍රජාවන් (KP) 1ට ඇතුලත් වන්නේ පිරිමි සමග ලිංගිකව හැසිරෙන පිරිමි (MSM), මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නා පුද්ගලයින් (PWID), සංක්‍රාන්ති ලිංගිකයන්, (TG) සහ ලිංගික ශ්‍රමිකයින් (SW)

මුඛ්‍ය ප්‍රජාවන් (KP) 2ට ඇතුලත් වන්නේ තරුණ තරුණියන්, සරණාගතයන් හා සංක්‍රමණිකයන්, කාන්තාවන් සහ ගැහැණු දරුවන්, නවයෞවන යෞවනියන්, සංචාරක සේවා සපයන්නන්, සිරකරුවන්, අනත්දරුවන්, අනතුරට භාජනය විය හැකි ළමුන් සහ මානව අරගලවලට මුහුණ දී ඇති ජනතාවන්

**3) පුද්ගලික අංශය**

අවුරුදු 3 ක කාලයක්වත් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය සමග යම් සම්බන්ධයක් හෝ ඊට ලැදියාවක් සහිතව ව්‍යාපාරික කටයුතු වල නියැලී සිටින, රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයයේ හෝ සමාගම් පනත යටතේ හෝ පාර්ලිමේන්තු පනතක් යටතේ හෝ ලියාපදිංචි කර ඇති ඕනෑම සමාගමක් හෝ වෘත්තීය සංගමයක්

**4) විශ්වාසය මත පදනම්වූ ආයතන**

අවුරුදු 3 ක කාලයක්වත් සෞඛ්‍ය අංශය සමග යම් සම්බන්ධයක් හෝ ඊට ලැදියාවක් සහිතව රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයයේ හෝ සමාගම් පනත යටතේ හෝ පාර්ලිමේන්තු පනතක් යටතේ හෝ ලියාපදිංචි කර ඇති ශ්‍රී ලංකාවේ කටයුතු කරන ඕනෑම ආගමික/ අධ්‍යාත්මික සංවිධානයක්

**5) අධ්‍යාපන අංශය**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන ලේකම් කාර්යාලයයේ හෝ සමාගම් පනත යටතේ හෝ පාර්ලිමේන්තු පනතක් යටතේ හෝ ලියාපදිංචි වී අවම වශයෙන් පසුගිය වසර තුනක්වත් ක්‍රියාකාරී වන සෞඛ්‍ය අංශයට සෘජුව සම්බන්ධ වූ හෝ උනන්දුවක් දක්වන ඕනෑම අධ්‍යාපන සංවිධානයක්

**6) එච්.අයි.වී / ඒඩ්ස් රෝගීන් සහ රෝගී කණ්ඩායම් අතර ජීවත්වන්නන්**

ශ්‍රී ලංකාව තුල අවුරුදු 3 ක කාලයක්වත් ක්‍රියාකාරී එච්.අයි.වී / ඒඩ්ස් සමග ජීවත්වන පුද්ගලයන්ගේ ඕනෑම සංවිධානයක්

**7) ක්ෂය රෝගීන් සහ රෝගී කණ්ඩායම් අතර ජීවත්වන්නන්**

ශ්‍රී ලංකාව තුල ක්ෂය රෝගීන් සමග ජීවත්වන්නන්, ක්ෂය රෝගය පිළිබඳව දැනුවත්භාවය නංවන, වැළැක්වීමේ කටයුතුවල යෙදෙන හෝ ඔවුන් හා සහයෝගයෙන් පසුගිය වසර තුනක්වත් ප්‍රජා කටයුතුවල යෙදෙන ඕනෑම සංවිධානයක්

සාමාජිකයකු ලෙස පත්වීමට හෝ ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධවීමට කැමති සංවිධාන සහ පුද්ගලයන් විසින් සිය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා තොරතුරු අදාල පෝරම මගින් ලබා දෙන ලෙස යාන්ත්‍රණ ලේකම් කාර්යාලය ඉල්ලයි. සාමාජිකත්ව අපේක්ෂක අයදුම්කරුවන් CCMSL සාමාජිකත්වය සඳහා තේරී පත්වීමට මෙන්ම ඡන්දදායකයින් ලෙසද සුදුකම් ලබයි. ඡන්ද දායක අයදුම්කරුවන් ඡන්දය ලබා දීමට පමණක් සුදුසුකම් ලබයි.

ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණයෙහි කාර්ය සංග්‍රහය, CCM හි සිවිල් සංවිධාන සාමාජිකයින් තෝරා ගැනීම සඳහා වන ඡන්ද විමසීම පිළිබඳ මාර්ගෝපදේශය, සිවිල් සංවිධාන සාමාජිකයකු බවට පත්වීම සඳහා ඡන්ද අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා වන අයදුම්පත, එම ඡන්දයෙහි ඡන්ද දායකයකු ලෙස ඉදිරිපත් වීමේ කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා වන අයදුම්පත යනාදිය වෙත පහත දැක්වෙන දිගුවෙන් ලගාවිය හැකිය.

**https://ccmsl.lk/si/vacancy-advertisements-si/**

**සියළුම කැමැත්ත ප්‍රකාශ කිරීම් ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ ලේකම් කාර්යාලය වෙත 2025 මැයි 22 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබිය යුතුය. ඔබ අයදුම්කරන කාණ්ඩය ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ සඳහන් කරන්න. තැපැල් මගින් අයදුම්කර නොමැතිව අනිකුත් සංන්නිවේදන මාධ්‍ය ඔස්සේ පමණක් කරනු ලබන අයදුම්පත් සලකා බලනු නොලැබේ. සුදුසුකම් සපුරන සහ කෙටි ලැයිස්තුගත කෙරෙන අයදුම්කරුවන්හට පමණක් දැනුම්දෙනු ලැබේ.**

වැඩිදුර තොරතුරු සහ විමසීම් සඳහා ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ ලේකම් කාර්යාලය අමතන්න.

**ශ්‍රී ලංකා දේශීය සම්බන්ධීකරණ යාන්ත්‍රණ ලේකම් කාර්යාලය**
**පළමු මහල, මහජන සෞඛ්‍ය සංකීර්ණය**
**555/5, ඇල්විටිගල මාවත**
**කොළඹ 5**
**දුරකථන අංක : 011 2369066**
**ඊමේල් :** ccmsrilanka@gmail.com